**ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය වෙනුවෙන් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව තහවුරු කළ නොහැකි විය.

(ආ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් එම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **අත්තිකාරම් ලැබීම්**<br>චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ලැබීම් හා ගෙවීම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගැනීමේදී භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල සඳහන් සංඛ්‍යා පදනම් කර ගත යුතුව තිබුණද අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.3,888,070 ක් හා රු.7,762,155 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | වර්ෂයේ ආරම්භයේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ දෙපාර්තමේන්තු පොත් අතර පැවති වෙනස නිරවුල් කිරීම සඳහා වූ සටහන හා වැරදි ශේෂයන් නිවැරදි කිරීම සඳහා වූ සටහන් නිසා ඇති වූවකි. |
| (ආ) **අග්‍රිම ගිණුම**<br>සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.23,306,998 ක වාසි සහගත අග්‍රිම ශේෂය සැසඳීම සඳහා අග්‍රිම ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතු වුවද අග්‍රිම ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | -එම- | ගැලපුම් ගිණුමක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තු පොත් අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.695,525,000 ක් වුවද , මූල්‍ය | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන පිළියෙල කල | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම හා වෙනත් ලැබීම් වෙන් වෙන් වශයෙන් සඳහන් කල යුතු වුවද |

| | | | |
|---|---|---|---|
| | කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.950,373,419 ක් ලෙස සටහන් කිරීම නිසා භාණ්ඩාගාර අග්‍රිමය රු.254,848,419 ක් වැඩියෙන් දක්වා තිබුණි. | යුතු වීම. | ප්‍රමාද දෝෂයකින් අනිකුත් ලැබීම්ද භාණ්ඩාගාර අග්‍රිම ලෙස සඳහන් කර තිබීම නිසා භාණ්ඩාගාර අග්‍රිම වැඩියෙන් සඳහන් කර ඇත. |
| (ආ) | විගණනය වෙත ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත මගින් තහවුරු කර ගත හැකි වූ රු.282,029,022 ක වෙනත් ලැබීම් , මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | වෙනත් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කල යුතු වීම. | ඉහත සිදු වූ ප්‍රමාද දෝෂය නිසා වෙනත් ලැබීම් වෙන් වෙන් වශයෙන් පෙන්වා නොමැති නිසා මෙම තත්වය ඇති වී ඇත. |

**1.6.3** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් නොවන ලැබීම් රු.1,022,597,791 ක් වුවද ,එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.1,010,972,881 ක් ලෙස සටහන් කිරීම නිසා ආදායම් නොවන ලැබීම් රු.11,624,910 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමට කටයුතු කිරීම. | අදාල මූල්‍ය ප්‍රකාශවල ශුද්ධ ලැබීම් සඳහන් කර ඇති බැවින් මෙම තත්ත්වය ඇති වී ඇත. මෙම තත්ත්වය විධිමත් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව පුද්ගල පඩිනඩි හා වෙනත් මෙහෙයුම් වියදම් , තැන්පත් ගෙවීම්, සහනාධාර ආපසු ගෙවීම වැනි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගලායාම් රු.1,004,110,628 ක් වුවද එය රු.323,229,812 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කිරීම නිසා රු.680,880,816 ක වෙනසක් පැවතුණි. | -එම- | පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය පමණක් ඇතුලත් වීම නිසා මෙම වරද සිදු වී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ ලෙස රු.19,444,224 ක් අයකර ගෙන තිබුණත්, මුදල් ප්‍රවාහ | -එම- | සවිස්තරාත්මක විස්තර ඉදිරිපත් කිරීම සඳහා කටයුතු නොකිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මෙම වටිනාකම දක්වා නොතිබුණි. | | ඇති අතර, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ණය ගෙවීම හා භෞතික වත්කම් අත්පත් කර ගැනීම් රු.40,042,863 ක් වුවත් ඊට අදාලව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලායාම් රු.635,652,759 ක් ලෙස දැක්වීම නිසා ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලායාම් රු.595,609,896 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | පිළිතුරු ලබා දී නැත. |

### 1.6.4 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | -------------------------------- |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ 6 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.206,255,463 ක් වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පිටපත්හි වටිනාකමක් දක්වා නොතිබීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකමක් ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තා යාවත්කාලීනව පවත්වා ගත යුතුවීම හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල එම අගයන් වාර්තා කිරීම. | සිගාස් ගිණුමේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම ඇතුලත්ව තිබුණද, එහි ලෙජර් ගිණුමේ සහ **BOSS** වාර්තාවේ වත්කම්වල තිබූ දත්තයන්හි වෙනස හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම ඇතුලත් නොකරන ලදී. මේ වන විට එම තොරතුරු නිවැරදිව සටහන් කිරීම සිදුකරමින් පවති. |
| (ආ) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය කාර්යලයකට ලබාදුන් මෝටර් බයිසිකල් 16 ක් විධිමත්ව පවරා ගෙන ඉන්වෙන්ට්‍රි ලේඛණවලට ඇතුලත් කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම්, ලේඛනයක සටහන් විය යුතුවේ. | ව්‍යාපෘතිය යටතේ ලබාදුන් මොටර් බයිසිකල් 16 ක් මෙම දෙපාර්තමේන්තුවේ රබර් සංවර්ධන නිලධාරින් වෙත ලබා දී ඇත. මෙම වත්කම්වල වටිනාකම් ඉදිරියේදී වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කිරීමට කටයුතු කරන බව |

කාරුණිකව දන්වා සිටිමු.

### 1.6.5 අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | භාණ්ඩාගාර අග්‍රිම (**ACA-3**) ආකෘතියේ වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් රු.31,712,815 ක් හා භාණ්ඩාගාර ලැබීම් රු.950,373,419ක් ලෙස දක්වා තිබුණද, මාසික ගිණුම් සාරාංශ අනුව එය පිළිවෙලින් රු.282,029,502 ක් හා රු.695,525,000 ක් බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව භාණ්ඩාගාර අග්‍රිම (**ACA-3**) ආකෘතිය පිළියෙල කල යුතු වීම. | (අ) සහ (ආ) අග්‍රිම වර්ගීකරණය කිරීමේ දෝෂයක් ඇති බැවින් එය නිවැරදි කිරීමටද සටහන් කර ගතිමි. |
| (ආ) | භාණ්ඩාගාර අග්‍රිමය පියවීම දෙපාර්තමේන්තු පොත් අනුව, වියදම් මගින් රු.957,086,234 ක් හා මුදල් මගින් රු.25,000,000 ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිතයේ රු.982,086,234 ක් වියදම් මගින් පියවීම ලෙස පමණක් දක්වා තිබුණි. | -එම- | පිළිතුරු ලබා දී නොමැත. |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **ඇප ලේඛනය**<br>ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මු.රෙ. 891(1) ප්‍රකාරව සේවක ඇප තැම්පතු ලේඛණයක් පවත්වාගෙන ගොස් තිබූ බවට සාක්ෂි සොයාගත නොහැකි විය. එහෙත් මින් ඉදිරියට සේවක ඇප තැම්පතු ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කරන |

| | | |
|---|---|---|
| | | බව කාරුණිකව දන්වමි. |
| **(ආ) හානි පිළිබඳ ලේඛනය** මොනරාගල සහ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලවල හානි පිළිබඳ ලේඛන යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | මු.රෙ. 110 ප්‍රකාරව මොනරාගල සහ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල වෙතින් වාර්තා වන ලද පාඩු හා හානි අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ "හානි පාඩු ලේඛනය" තුළ යාවත්කාලීන කර ගැනීම සඳහා උපදෙස් ලබාදී ඇත. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | - | සෑම අස්ථිත්වයක් විසින්ම මූල්‍ය ප්‍රකාශන සමඟ රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්වයන් වාර්ෂික කාර්යසාධන වාර්තා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුවීම. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16.2 වගන්තියට අනුව ඉදිරිපත් කල යුතු මූල්‍ය ප්‍රකාශ හා කාර්යසාධන වාර්තාව ඉදිරි වසරේදී මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ)**<br>**----------------**<br>**(i) මු. රෙ 104 (4)** | 2,091,628 | ඉකුත් වසරේ ඇති වූ ගින්නකින් දෙපාර්තමේන්තු ලොරි රථය ඇතුලු තවත් රථ දෙකක් විනාශයට පත් වීමෙන් වූ හානිය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා මාස 06 ක කාලයක් ගත කර තිබුණද, ඊට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හානිය සිදු වූ පසුව ඒ අනුව කටයුතු කල යුතු වේ. | මෙම පරීක්ෂණයේ පූර්ණ වාර්තාවක් මාස 02 ක් ඇතුලත ඉදිරිපත් කිරිමට නොහැකි වී ඇත්තේ පොලිස් පරීක්ෂණ අවසන් නොවූ බැවිනි. තවද මූලික විමර්ශන වාර්තාව අනුව සිද්ධිය සම්බන්ධයෙන් වගකිවයුතු අයෙකු හඳුනාගත නොහැකි බවට නිර්දේශ කර ඇති අතර අදාල රක්ෂණ සමාගම ඒ සඳහා රු.338,000 ලබාදීමට එකඟතාවය පල කර ඇත. |
| **(ii) මු. රෙ. 106 (3) (ආ)** | - | පාඩු පොතෙන් කපා හැරීමේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් හෝ නැතහොත් ඊළඟ මුදල් වර්ෂයේ ප්‍රතිපාදන මඟින් හෝ අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගත යුතු විය. එහෙත් එසේ නොකර ඇස්තමේන්තුවේ ඇතුළත් නොමැති වැය විෂයයක් සඳහා මු. රෙ. 66 මඟින් ප්‍රතිපාදන මාරු කර, සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ ණය ශේෂ කපා හැර තිබුණි. | අයවැය ඇස්තමේන්තුවේ වැය විෂයක් නොමැති විට මු.රෙ.65(4)(iv) අනුව ක්‍රියා කල යුතු වීම. | පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් නොකර අනුමත වැය විෂයයන්වල ප්‍රතිපාදන ඉතිරිවීම් වලින් අවශ්‍යතා සපුරා ගන්නා ලෙසට භාණ්ඩාගාරය මඟින් උපදෙස් ලබා දී ඇත. |
| **(iii) මු. රෙ. 215 (3)** | 12,965,568 | පදියතලාව තවානේ සංවර්ධන කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘතියකින් | වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන ලබා ගන්නා ව්‍යාපෘතිය සඳහා විදේශාධාර ව්‍යාපෘතිවලින් ප්‍රතිපාදන | දැනට පදියතලාව තවානේ සංවර්ධන කටයුතු නිම කර ඇති අතර, ඉදිරියේ දී එම මුදල් භාවිතා කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදලින් ලද ප්‍රමාණය තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ලබා නොගැනීම. | සිදුවන බව කාරුණිකව දන්වා සිටිමි. |
| **(iv) මු. රෙ. 571 (2)** | 2,002,313 | තැන්පතු ගිණුම් 04 කට අදාළව වර්ෂ 02 කට වඩා කල්ගත වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මු.රෙ. අනුව කටයුතු කර නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ)2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සෑම මාස 06 කට වරක් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවද, ප්‍රාදේශීය කාර්යාල 04 ක් විසින් වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව පරීක්ෂාවක් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව සෑම මාස 06 කට වරක් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් කිරීම. | ඉන්ධන පරීක්ෂාව නොකර ඇති ප්‍රාදේශිය කාර්යාලවලට සෑම මාස 06 කට වරක්ම වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂා කරන මෙන් උපදෙස් ලබා දිමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 වර්ෂයේ මාස කිහිපයක ඉල්ලුම් කළ අග්‍රිමය, සැලසුම් කළ අග්‍රිමය සමඟ සැසඳීමේදී අග්‍රිමය ඉල්ලුම් කිරීම සියයට 19 ත්, සියයට 42 ත් අතර ප්‍රමාණයකින් වැඩි වී තිබූ අතර ඒ අනුව වර්ෂයේ අග්‍රිම අවශ්‍යතාවය නිසි පරිදි සැලසුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | වර්ෂයේ ඉටුකරගැනීමට අපේක්ෂිත කාර්යයන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට ඇතුලත් කිරීමට කටයුතු කළයුතු වීම. | වර්ෂයේ අග්‍රිම නිසි පරිදි සැලසුම් කිරීම සඳහා අග්‍රිම නිසි පරිදි ලැබිය යුතුය. අක්මුදල් නොලැබීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මු. රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා වැය විෂයයන් 07 ක් යටතේ සලකා තිබුණ රු.මිලියන 941.7 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 331.49 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එය සලසා තිබුණ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 36 දක්වා ප්‍රමාණයක් වී තිබුණි. | කාර්යභාරය ඉටු කිරීම ආරම්භවන කාල වකවානු නිශ්චය කර වර්ෂයේදි ඉටු කළ හැකි කාර්ය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතපාදන සලසා ගත යුතු වීම. | අක්මුදල් නිසි පරිදි නොලැබීම නිසා ප්‍රතිපාදනවලින් ගෙවීම් සිදු කිරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරි වීමක් වී ඇත. අක්මුදල් නිසි පරිදි ලැබුණි නම් මු.රෙ. 66 යටතේ මූල්‍ය ප්‍රතිපාදන මාරු කිරීම් තුලින් වැය විෂයන් අතර ඉතිරි වීම් මෙන්ම ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා ඇති බැදීම්ද වලක්වා ගත හැකිව තිබුණි. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 09 ක් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.2,699,358 ක බැදීම්වලට එළඹ තිබුණි. | නිවැරදිව බැදීම් හා බැරකම් හඳුනා ගැනීම කල යුතු වේ. | අක්මුදල් නිසි පරිදි ලැබුණේ නම් මෙම බැදීම් අදාල වැය විෂයන්වලට මාරු කර ගෙවීමට හැකියාව තිබුණි. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කර | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එම | නිකුත් කරන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම කර දින 10 |

| | | |
|---|---|---|
| දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී ලබා දී තිබූ එකතුව රු.**100,500** ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම **06** ක් පියවීම සඳහා දින 04 ත්, දින **210** ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි. | රෙගුලාසිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XLVII** පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුවීම. | ක් ඇතුළත පියවීමට කටයුතු කරන ලෙස සියළුම නිලධාරීන් වෙත අවධාරණය කරන ලදී. |

**2.5 තැන්පත් ශේෂයන්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තුරුසවිය අරමුදලින් 2017 වර්ෂයේ ලද මුදලින් ඉතිරි රු.1,085,962 ක් අදාල අරමුණ නිමවීමෙන් පසුව, නිරවුල් කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කාර්යය නිම කල පසු එම මුදල් පියවීම සඳහා කටයුතු කල යුතු වේ. | මෙම මුදල් පිළිබඳව තුරුසවිය අරමුදලින් විමසීම් කර නිවැරදි තොරතුරු ලබාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත්, එහි 3 (ආ) ඡේදය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය, වාර්ෂික අක් මුදල් සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම යනාදිය පිළිබඳව විස්තර ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය සහ අක් මුදල් සැලැස්ම පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුවීම. | අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය, අක් මුදල් සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම යනාදිය පිළිබඳ විස්තර ඇතුලත් කර නොමැති බව පිළිගනිමි. ඉදිරි වර්ෂවල සිට එකී තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>නිර්දේශය</th><th>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th></tr>
<tr><td>(අ)</td><td>සමාලෝචිත වර්ෂයේ කුඩා රබර් වතුහිමියන්ගේ හා වැවිලි සමාගම්වල පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 1,000 ක හා 500 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණද ඉන් නැවත වගාකර තිබුණේ ඉඩම් හෙක්ටයාර් 523 ක හා හෙක්ටයාර් 319 ක පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලසුම් කල ප්‍රමාණයෙන් සියයට 48 ක් හා සියයට 36 ක් වී තිබුණි.</td><td>සැලසුම් කළ ප්‍රමාණයන් ලගා කර ගැනීමට කටයුතු කළ යුතු වීම.</td><td>2018 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කර ඇති නැවත වගා අවසරපත්‍ර සඳහා 2019 වසර ආරම්භක කාල සීමාවේදී ද වගා කර ඇති බැවින් මේ වන විට කුඩා රබර් වතු හිමියන් හා වැවිලි සමාගම් විසින් සිදුකර ඇති නැවත වගා බිම් ප්‍රමාණය පහත පරිදි වේ.
<table>
<tr><th>අංශය</th><th>ඉලක්ක බිම් ප්‍රමාණය</th><th>වගාකර ඇති බිම් ප්‍රමාණය</th><th>ප්‍රතිශතය %</th></tr>
<tr><td>කුඩා රබර් වතු හිමියන්</td><td>1000</td><td>524.61</td><td>52.40</td></tr>
<tr><td>වැවිලි සමාගම්</td><td>500</td><td>338.644</td><td>67.72</td></tr>
</table>
</td></tr>
<tr><td>(ආ)</td><td>සමාලෝචිත වර්ෂයේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව ඉඩම් හෙක්ටයාර් 750 ක වගා කිරීමට සැලසුම්කර තිබුණද වගාකර තිබුණේ ඉඩම් හෙක්ටයාර් 342.5 ක පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලසුම් කල ප්‍රමාණයෙන් සියයට 54 ක් වී තිබුණි.</td><td>සැලසුම් කළ ප්‍රමාණයන් ලගා කර ගැනීමට කටයුතු කළ යුතු වීම.</td><td>2018 දෙසැම්බර් 31 දිනට පෙර පැල සිටුවා අවසන් කළ යුතු බවට සඳහන් කර අප විසින් වගා අවසරපත්‍ර නිකුත් කලද පැල සිටුවීමේ කාල සීමාව වෙනස් වීම නිසා මෙම ඉලක්ක ලගා කර ගැනීමට නොහැකි වී ඇත.<br>එමෙන්ම, වෙළඳපොලේ රබර් මිල පහත වැටීම, ශ්‍රම බලකායේ හිඟය ආදී කරුණු හේතුවෙන්ද වියළි රබර් කි.ග්‍රෑ. 01 ක නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන්ද වගාකරුවන් වෙනත් ආදායම් ලැබිය හැකි භෝග කෙරෙහි නැඹුරු වෙමින් පැවතීම නිසා මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම අපහසු වී ඇත.<br>මේ සඳහා විසඳුමක් වශයෙන් රබර් වගාකරුවන් සඳහා රජය මගින් ලබා දෙන සහනාධාර මුදල 2019 ජනවාරි 01 දින සිට දෙගුණයක් කර ඇත.</td></tr>
</table>

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුද්ගලික සමාගමක් සමඟ 2016 මාර්තු 02 දින රබර් තොරතුරු කළමනාකරණ පද්ධතියක් | වසරක් තුළ පද්ධතියක් සංවර්ධනය කර අවසන් කිරීම වෙනුවෙන් ගිවිසුම් | දැනට ආරම්භ කොට ඇති නියමු වැඩසටහන් වල ප්‍රතිඵල ඇගයීම් කිරීමෙන් පසු අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලවල |

| | | |
|---|---|---|
| (RIMS) සංවර්ධනය වෙනුවෙන් ගිවිසුම්ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වා ඒ සඳහා රු.මිලියන 17.45 ක වියදමක් දරා තිබුණද එම ගිවිසුම ප්‍රකාරව අදාළ කාර්යය 2016 දෙසැම්බර් මස නිම කළයුතු වුවත් 2019 මැයි මස වන විටත් සම්පූර්ණයෙන් අවසන් කර නොතිබුණි. | ගත වී ඇති හෙයින් කඩිනමින් එම සංවර්ධන කටයුතු නිමකර අපේක්ෂිත අරමුණු ඉටු කර ගත යුතුවීම. | පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කරනු ලබන බව කාරුණිකව පෙන්වා දෙමි. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2019 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආයතන සතු ඉඩම්වල ඉදිකර තිබූ නිල නිවාස 24 ට අදාල ඉඩම්වල, අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරාගැනීමේ කටයුතු කඩිනම් කර ගැනීම තුළින් ඒවා නිරවුල් කරගැනිමට කටයුතු කිරීම. | පවරා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ එකතාවය විමසා ඇත. ඇතැම් ඉඩම් ප්‍රාදේශිය ලේකම්භාරයේ පවතින අතර, මේ වන විට මෙම ඉඩම් දෙපාර්තමේන්තුවට |

| | | | |
|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය 2017 වර්ෂයේ සිට පෞද්ගලික ගොඩනැගිල්ලකට රැගෙන තිබූ අතර ඒ සඳහා ගොඩනැගිලි කුලිය වැට් බදු සහිතව එකතුව වශයෙන් රු.මිලියන 65.25 ක් ගෙවා තිබුණි. වසර 10 කට වැඩි කාලයකට පෙර සිට බත්තරමුල්ල ප්‍රදේශයෙන් රු.මිලියන 59.3 ක් ගෙවා මිල දී ගත් පර්චස් 75 ක ඉඩම ප්‍රයෝජනයට ගෙන ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඇති හැකියාව සොයා බලා නොතිබුණි. | රජයේ මුදල් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට හැකි වන ලෙස ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා යෝජිත ඉඩමෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා 2011 වසරේ ඉදිරිපත් කර ඇත. එහෙත් දෙපාර්තමේන්තුව ඉදිකිරීමට සුදුසු රබර් බහුලව වගා කරන ප්‍රදේශයක් තෝරා ගන්නා ලෙසට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/2041/531/017 සහ 2011 ඔක්තෝබර් 10 දිනැතිව දැනුම් දී ඇති අතර එම ස්ථානය තෝරා ගැනීමට ඇතිවූ ගැටලුකාරි තත්ත්වයක් මත ඉදිරි කටයුතු සිදු කිරීම නැවතී ඇත. මෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා සහ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අනුමැතිය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. |

**3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුදල් රෙගුලාසියේ 880 ප්‍රකාරව ඇප තැබිය යුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 70 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තු ප්‍රතිශෝධනය කර එම වාර්තා සෑම වර්ෂ 03ක් අවසානයේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කර | රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතුවීම, බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු | මෙම දෙපාර්තමේන්තුවේ සේවක ඇප තැන්පතු ලේඛණයක් පවත්වාගෙන ගොස් තිබූ බවට සාක්ෂි සොයාගත නොහැකි විය. එහෙත් මින් ඉදිරියට මු.රෙ. 880 පරිදි සේවක ඇප තැන්පත් අදාල නිලධාරීගෙන් ලබාගෙන ලේඛණ පවත්වාගෙන යාමට කටයුතු කරන බවත් සෑම වර්ෂ 03 ක් අවසානයේදීම විගණකාධිපති වෙත |

| | | |
|---|---|---|
| නොතිබුණි. | කරන බවට ඇප තැබිය යුතුවීම හා ලැයිස්තු ප්‍රතිශෝධනය කර එම වාර්තා සෑම වර්ෂ 03ක් අවසානයේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවීම. | ඉදිරිපත් කරන බවත් කාරුණිකව දැනුම් දෙමි. |

**3.7 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 මැයි 18 දින දෙපාර්තමේනතුවේ නිල වෙබ් පිටුව සකස් කිරීම සඳහා ඊට අදාල රු.420,000 ක වටිනාකම හා සමාලෝචිත වර්ෂයේ ජුනි මස සිට වර්ෂයක සේවා ගාස්තු ලෙස රු.120,000 ක් ගෙවා තිබුණද 2019 මැයි 30 දක්වා නිල වෙබ් පිටුව ක්‍රියාත්මක කර නොතිබුණි . | සේවා ගාස්තු ගෙවූ දින සිට අදාල සේවාව ලබා ගැනීම සඳහා නොහැකි වූ කාරණා සම්බන්ධව සොයා බැලීම හා හැකි ඉක්මනින් නිල වෙබ් අඩවිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. | • දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම 2018 මැයි මස වන විට අවසන්ව කරන ලද අතර එහි දිගුව **(url)** http://www.rubberdev.gov.lk/home/ ලෙස ක්‍රියාත්මක කරන ලදී.<br>• පසුව වෙබ් අඩවියේ පරිශීලනය කිරීමේ පහසුව තකා එහි දිගුව **(url)** http://www.rubberdev.gov.lk/ ලෙස වෙනස් කරන ලදී. |

**3.8 වැඩිපුර ගෙවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෑගල්ල දෙහිඕවිට රබර් සංවර්ධන නිලධාරී කාර්යාලයේ අලුත්වැඩියාවක් සිදුකිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී මැනුම් පත හා බිල්පත අනුව roof and roof plumbing work යටතේ flashing ගැසීම සිදු නොකර තිබියදී ඒ සඳහා රු.84,884 ක් ගෙවා තිබුණි. | එක් අයෙකුගේ වැඩක් තව අයෙකුගේ පරිකෂාවට ලක් වන ආකාරයෙන් වැඩ බෙදීම් කළ යුතුවේ. එසේම ගෙවීම් කිරීමේදී භෞතික කාර්ය සාධනය පිළිබඳව ගැඹුරින් සොයා බැලිය යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරන අතර අභ්‍යන්තර පාලනය තවදුරටත් නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් සියයට 11 ක වට්ටමක් ලබා දී තිබියදී ඒ සඳහා ගෙවීම් කිරීමේදි සියයට 5 | -එම- | -එම- |

වට්ටමක් පමණක් අඩු කිරීම නිසා ආයතනය රු.154,782 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් සමාලෝචිත වර්ෂයේ ඇති කළ අධ්‍යක්ෂක (ප්‍රාදේශීය) තනතුරු 05 ක්, ගණකාධිකාරි තනතුරු 03 ක්, නීති නිලධාරී තනතුරු, නියෝජ්‍ය අධ්‍යක්ෂක හා සහකාර අධ්‍යක්ෂක තනතුරු වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට කඩිනම්ව කටයුතු කළ යුතු වේ. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කරමින් පවතී. |